ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# University of Sri Jayewardenepura

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## External Degrees and Extension Courses Unit

## විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ නව නිර්දේශයට අන්තර්ග්‍රහණය කළ සිසුන් සඳහා උපාධි I පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කිරීම

**විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ පැරණි නිර්දේශය යටතේ (2009 හෝ ඊට පෙර) ලියාපදිංචි වී සිට නව නිර්දේශය වෙත අන්තර්ග්‍රහණය වූ සිසුන් සඳහා පමණක් මෙම නිවේදනය අදාළ වේ.**

පැරණි නිර්දේශයේ සිට නව නිර්දේශයට අන්තර්ග්‍රහණය කළ සිසුන්ට අදාළ උපාධි I පරීක්ෂණයට අදාළ ප්‍රතිඵල පහත **Link 1 - Part I (Absorbed Students)** මගින් බාගත කළ හැකිවේ.

- එහිදී ලැබෙන ප්‍රතිඵල ලේඛනයේ පළමුව දැක්වෙන්නේ සිසුන් විසින් විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි **පැරණි නිර්දේශය යටතේ උපයා ගත් ලකුණු නව නිර්දේශයේ උපාධි I කොටසෙහි ඊට අදාළ විෂය ඒකකයන්ට ඇතුලත් කර, නව නිර්දේශයේ ශ්‍රේණි ලකුණු පටිපාටියට පරිවර්තනය කර නිකුත් කරන ප්‍රතිඵලය** වේ.

- ප්‍රතිඵල ලේඛනයේ දෙවනුව දැක්වෙන්නේ නව නිර්දේශය යටතේ 2022 ජනවාරි මස පැවැති උපාධි I පුනර් පරීක්ෂණයේ ඔබ පෙනී සිටි විෂයන්ට අදාළ ප්‍රතිඵලයයි.

### උපාධි I කොටසට අදාළ සමස්ථ ප්‍රතිඵලය (Overall Results)

**උපාධි I කොටසට අදාළ සමස්ථ ප්‍රතිඵලය (Overall Results) ගණනය කර ඇත්තේ පරිවර්තනය කළ ප්‍රතිඵල හා 2022 ජනවාරි පැවති උපාධි I පුනර් පරීක්ෂණයේ ප්‍රතිඵල එක්ව ගෙන, විෂයන් 07 සඳහා ඒ එක් එක් විෂයට ලබා ඇති වැඩිම ශ්‍රේණිය සැලකිල්ලට ගෙන වන අතර 2022 ජනවාරි මස පැවැති උපාධි I පුනර් පරීක්ෂණයට පෙනී නොසිටි සිසුන්ගේ සමස්ථ ප්‍රතිඵලය පරිවර්තනය කළ ප්‍රතිඵලය (Converted Results) මත පමණක් පදනම් ව ගණනය කර ඇත.**

- **මෙම කරුණ පැහැදිලි කර ගැනීමට පහත උදාහරණය සලකන්න.**

(1) Converted Results From Old Syllabus to New Syllabus

| Subject | Grade |
|---|---|
| BME 1501 | D+ |
| BME 1502 | C |
| BME 1503 | C+ |
| BME 1504 | AB |
| BME 1505 | C+ |
| BME 1506 | C+ |
| BME 1007 | AB |

(2) Part I Repeat Examination - Conducted on January 2022

| Subject | Grade |
|---|---|
| BME 1501 | E |
| BME 1504 | C |
| BME 1007 | C |

Considering (1) & (2) Overall Results : Pass

**ඉහත උදාහරණයේ දැක්වෙන ශිෂ්‍යයා පරිවර්තනය කළ ප්‍රතිඵල අනුව BME 1501, BME 1502, BME 1503, BME 1505, BME 1506 විෂයන් සමත්ව ඇති අතර ඉන්පසුව 2022 ජනවාරි නව නිර්දේශය යටතේ පැවැත්වූ උපාධි I පුනර් පරීක්ෂණයට පෙනී සිට BME 1504 හා BME 1007 යන විෂයන් සමත්ව ඇත.**

**ඉහත උදාහරණයේ වර්ණ ගන්වා ඇත්තේ මෙම ශිෂ්‍යයාගේ GPA අගය ගණනයට යොදාගත් වැඩිම ශ්‍රේණි වේ.**

**මෙහිදී BME 1501 විෂයට පැරණි නිර්දේශය යටතේ දුර්වල සාමාර්ථයක් (D+) ලබා ඇති නිසා නැවත පෙනී සිටීමට ශිෂ්‍යයාට දන්වා ඇත. නමුත් 2022 ජනවාරි පරීක්ෂණයේදී BME 1501 විෂයට E සාමාර්ථයක් ලැබුවද BME 1504 හා BME 1007 යන විෂයන්හි ප්‍රතිඵල අනුව උපාධි I කොටස සමත්වීමට අවශ්‍ය GPA අගය හා අනෙකුත් නිර්ණායක සම්පූර්ණ වන නිසා මෙම ශිෂ්‍යයා BME 1501 විෂයට ලබාගෙන ඇති D+ සාමාර්ථය සමග උපාධි I කොටස සමත් ව ඇත.**

**මෙහි BME 1007 සම්භාර අගය රහිත (Non-credit) විෂය ඒකකයක් වන අතර GPA ගණනය කිරීමේදී සැලකිල්ලට නොගැනේ. එම විෂය සමත් වීමට අවම C සාමාර්ථයක් ලබාගත යුතුවේ.**

## සැලකිය යුතුයි

1. නව නිර්දේශයේ විභාග සමත්වීමේ නිර්ණායක පිළිබඳ දැනුවත් වීමට www.external.sjp.ac.lk වෙබ් අඩවියේ මුල් පිටුවේ (Home Page) ඇති Quick Links යටතේ පල කර තිබෙන Faculty of Management Studies and Commerce Prospectus පරිශීලනය කරන්න.

2. මෙම ප්‍රතිඵල ලේඛන සිසුන්ගේ දැන ගැනීම සඳහා පමණක් වන අතර අන්තර්ග්‍රහණය සඳහා වන විශ්වවිද්‍යාලයේ සනාතන සභා තීරණය අනුව අවසාන ප්‍රතිඵල ලේඛනය උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසුව නිකුත් කරනු ලැබේ.

3. මීට ඉහතදී දැනුම් දුන් පරිදි අන්තර්ග්‍රහණය කළ සිසුන් සඳහා''**විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය**''සම්පූර්ණ කිරීමට ලබාදී ඇති කාලය 2023-12-31 න් අවසන්වේ.



**සහකාර ලේඛකාධිකාරී**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
2022-08-08

**විමසීම්: 011 5929 791**
**(රජය විසින් නියම කල රාජකාරී දිනයන්හි පෙ.ව. 8.30 - ප.ව. 4.00 අතර)**